DOI: https://doi.org/10.4038/jdrra.v3i2.91

The Journal of Desk Research Review and Analysis, Vol. 3, Issue 2, 2025, 114 - 124

THE IDEAL STATE POLICY ON THE TREASURY: A STUDY BASED ON CLASSICAL INDIAN LITERARY SOURCES

RMGW Dissanayaka[1]

Abstract

The power of the king and the state is fundamentally determined by the strength of the state treasury. Therefore, it is the responsibility of the ruler to maintain the treasury as a prosperous and robust institution. The safeguarding of the treasury—which defines both the ruler's and the state's authority—the appointment of its heads, the production of wealth, or the collection of taxes must all be conducted thoughtfully and carefully by the ruler. How should the ruler carry out these responsibilities? Indian literary sources have discussed this question in detail. Drawing from those sources, this study seeks to identify the qualities of the individual to whom the treasury should be entrusted, the duties of that person, the manner in which taxes should be collected to strengthen the treasury, and how the ruler should implement this process. According to Indian literary sources, appointing a virtuous and capable person with sound knowledge of economics to head the treasury is key to achieving the economic prosperity expected by the king. This study raises critical questions: Can the treasury be strengthened through an equitable tax policy? Can economic growth be achieved by such means? Following historical research methodology, this study conducts a comparative analysis of the ideas discussed in Indian literary sources. These sources highlight that the treasury is the foundation of the state. The success and prosperity of all institutions within the state's administrative framework depend on the development of the treasury. Since this institution has a profound impact on both the state's mechanism and the ruler himself, Indian sources strongly emphasize that the ruler must pay special attention to it, more so than to any other institution. From the appointment of a custodian to the achievement of prosperity, the ruler must remain actively and responsibly engaged in managing the treasury. The leadership of the treasury should be selected after thorough scrutiny, taking into account not only the individual's economic knowledge but also their behavioral patterns and personal character. Regarding the method of tax collection, Indian literary sources advise that taxes should be imposed in a way that does not burden the populace—only after closely observing all economic conditions. The process is likened to extracting juice from sugarcane or milk from cows—careful, sustainable, and considerate. These sources stress that the necessity of tax collection should be explained to the people and should be carried out with mutual consent. This approach, they suggest, enables the ruler to achieve the desired level of economic prosperity.

Keywords: King, State, Treasury, Treasurer, Taxation.

---

[1]Department of History, University of Kelaniya, Sri Lanka.

Email: wasanthad@kln.ac.lk https://orcid.org/0009-0003-7096-4112

The Journal of Desk Research Review and Analysis © 2025 by The Library, University of Kelaniya, Sri Lanka is licensed under CC BY-SA 4.0

Received date: 07.06.2025 Accepted date: 01.09.2025

Print Publishing Date: 31.10.2025 Web Publishing Date: 31.10.2025

The Journal of Desk Research Review and Analysis, Vol. 3, Issue 2, 2025, 114 - 124

රාජ්‍ය භාණ්ඩාගාරය සම්බන්ධයෙන් රාජ්‍ය ප්‍රතිපත්තිය කවරාකාර විය යුතු ද ? යන්න භාරතීය සාහිත්‍ය මූලාශ්‍රය ඇසුරෙන් කරනු ලබන අධ්‍යයනයක්

ආර්. එම්. ජී. වසන්ත දිසානායක

සාරසංක්ෂේපය

රජුගේ හා රාජ්‍යයේ බලය තත් රාජ්‍යයේ භාණ්ඩාගාරයේ ශක්තිය මත තීරණය වී ඇති බැවින් එය වඩාත් සමෘද්ධිමත් ආයතනයක් ලෙස පවත්වාගෙන යාමේ වගකීම පාලකයා විසින් දැරිය යුතුව පවතී. තමාගේ හා රාජ්‍යයේ බලාධිකාරිත්වය නිර්ණය කරන භාණ්ඩාගාරය රැකබලා ගැනීම, එයට ප්‍රධානීන් පත්කිරීම හා ආර්ථික උත්පාදනය එසේත් නැති නම් බදු අයකිරීම කවරාකාරයෙන් සිදුකරන්නේ ද යන්න පාලකයා විසින් ම ඉතා කල්පනාකාරිව සිදු කළ යුතු කාර්යයන් ය. පාලකයා මත පදනම්ව ඇති මෙම කාර්යයන් සිදු කළ යුතු වන්නේ කෙසේ ද ? යන්න පිළිබඳව කරුණු රැසක් භාරතීය සාහිත්‍ය මූලාශ්‍රය තුළ සාකච්ඡාවට ලක්ව ඇත. එම මූලාශ්‍රය ඇසුරෙන් භාණ්ඩාගාරය භාරදිය යුතු පුද්ගල චරිත කවරේ ද ? ඔහුගේ කාර්යභාරය කුමක් විය යුතු ද ? භාණ්ඩාගාරය ශක්තිමත් කිරීම සඳහා බදු අය කළ යුතු ආකාරය හා පාලකයා එය කළ යුතු වන්නේ කෙසේ ද ? යන්න හඳුනාගැනීම මෙම පර්යේෂණයේ මුඛ්‍ය අරමුණු විය. භාරතීය සාහිත්‍ය මූලාශ්‍රය පෙන්වා දෙන ආකාරයට ආර්ථිකය පිළිබඳව මනා අවබෝධයක් තිබෙන යහපත් ශ්‍රේෂ්ඨ ගති ලක්ෂණ ඇති පුද්ගලයකු භාණ්ඩාගාරයේ නායකත්වයට පත්කර ගැනීමෙන් රජු අපේක්ෂා කරන ආර්ථික සමෘද්ධිය ළඟාකර ගත හැකි ද ? භාණ්ඩාගාරය දරදඬු බදු ප්‍රතිපත්තියක් ක්‍රියාවට නැංවීමෙන් ශක්තිමත් කරගත හැකි ද ? යන ගැටලු ඉස්මතු කරගනිමින් මෙම පර්යේෂණය සිදු කරන ලදි. ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදයට අනුගතව භාරතීය සාහිත්‍ය මූලාශ්‍රය තුළ සාකච්ඡාවට ලක්වන කරුණු සංසන්දනාත්මකව අධ්‍යයනයට ලක්කරන ලදි. භාරතීය සාහිත්‍ය මූලාශ්‍රය පෙන්වා දෙන ආකාරයට භාණ්ඩාගාරය යනු රාජ්‍යයේ මූලයයි. රාජ්‍ය පාලන සංවිධානයේ සියලු ආයතනවල සාර්ථකත්වය හා සමෘද්ධිය භාණ්ඩාගාරයේ අභිවෘද්ධිය මත තීරණය වී ඇත. මෙම ආයතනය රාජ්‍ය යාන්ත්‍රණයට මෙන්ම පාලකයාට සුවිශේෂිත බලපෑමක් කරන බැවින් පාලකයා අන් සියලු ආයතනවලට වඩා මෙයට අවධානය යොමු කොට කටයුතු කළ යුතු බව භාරතීය සාහිත්‍ය මූලාශ්‍රය අවධාරණාත්මක ස්වරූපයෙන් සිහිපත් කොට තිබේ. මෙම ආයතනයේ භාරකාරත්වය පිරිනැමීමේ සිට එය සමෘද්ධිමත් තත්ත්වයට පත්කරන තෙක් නොනම් මෙහෙවරක් පාලකයා වෙතින් විය යුතු බව එම මූලාශ්‍රයේ සිහි කැඳවීමයි. මනා අධීක්ෂණයකින් පසුව මෙහි නායකත්වය තෝරාගත යුතු අතර එහිදී ආර්ථිකය පිළිබඳ දැනුම පමණක් නොව ඔහුගේ චර්යා රටාව මෙන්ම ගති ලක්ෂණ ද සැලකිල්ලට භාජනය කළ යුතු බව තත් මූලාශ්‍රය පැහැදිලිව පෙන්වා දී තිබේ. බදු එකතු කරගැනීම කෙසේ සිදු කළ යුතු ද යන්න සම්බන්ධයෙන් අවධානය යොමු කරන භාරතීය සාහිත්‍ය මූලාශ්‍රය ප්‍රජාව පීඩාවට පත් නොකොට, සියලු ආර්ථික තත්ත්වයන් නිරීක්ෂණය කොට, තල් හා රට ඉඳි ගස්වලින් සාරය ගන්නා සේ, දෙනගෙන් කිරි දොවන්නා සේ බදු අයකර ගැනීම ඇගයීමට ලක්කරයි. බදු ගැනීමේ අවශ්‍යතාවය සිහිපත් කොට එය මහජනයා හා ඇති කරගන්නා සම්මුතියක් තුළින් සිදු කළ යුතු කාර්යයක් බව අවධාරණය කරන භාරතීය සාහිත්‍ය මූලාශ්‍රය එයින් පාලකයා අපේක්ෂා කරන ආකාරයේ ආර්ථික සමෘද්ධියක් ඇති කරගැනීමට අවකාශ සැලසෙන බවත් පෙන්වා දී තිබේ.

ප්‍රමුඛ පද: රජු, රාජ්‍යය, භාණ්ඩාගාරය, භාණ්ඩාගාර ප්‍රධානියා, අයබදු

හැඳින්වීම

අතීතයේ පැවති රාජාණ්ඩු පාලන සංවිධාන සහිත පාලන තන්ත්‍රයන්හී ද, වර්තමාන ලෝකයේ බලවත් යැයි සම්මත ඇමරිකාව, චීනය, රුසියාව, ප්‍රංශය, ජර්මනිය, එක්සත් රාජධානිය හා ජපානය වැනි ප්‍රජාතාන්ත්‍රික රාජ්‍යයන් අතර ද බලවත් බවේ විවිධත්වය එසේත් නැති නම් ඒ ඒ රාජ්‍යයන් අතර දක්නට ලැබෙන උච්චාවචනයන් නිර්මාණය වී තිබෙනුයේ ඔවුන් විසින් ගොඩනඟාගත්, ගොඩනඟාගෙන තිබෙන ආර්ථික ශක්තිය මතයි. ආර්ථික ශක්තියේ බලපෑම පුද්ගල චරිතවලට මෙන්ම රාජ්‍යයන්ට ද පොදු වූ තත්ත්වයකි. ඉදින් කිසියම් රාජ්‍යයක් සංවර්ධිත රාජ්‍යයක් ලෙස ඔසවා තැබීමට අපේක්ෂා කරන්නේ නම් එම රාජ්‍යයේ භාණ්ඩාගාරය ඉතා ශක්තිමත් පදනමක් මත විධිමත් ලෙසින් ගොඩනැඟීමට කල්පනා කළ යුතු ය. එය ශක්තිමත් පදනමක් මත ගොඩනඟන්නට නම් එහි නායකත්වය අතීත, වර්තමාන හා අනාගත යන කාලත්‍රයේ ආර්ථික රටාවේ හැසිරීම පිළිබඳ මනා අවබෝධයක් තිබෙන, වංචාව දූෂණය, කපටි බවෙන් තොර, යහපත් පුද්ගලයකු යටතට පත් කිරීමටත්, එහි ශක්තිමත් බව ඉතා සංවිධිත බදු ප්‍රතිපත්තියක් මතින් ගොඩනැංවීමටත් කටයුතු කළ යුතුව ඇත. භාණ්ඩාගාරයේ නායකත්වය පිළිබඳව මෙන්ම රාජ්‍යයක බදු ප්‍රතිපත්තිය කවර මුහුණුවරක් ගත යුතු ද යන්න පිළිබඳව භාරතීය සාහිත්‍ය මූලාශ්‍රය දක්වන කරුණු මෙම පර්යේෂණාත්මක ලිපියෙන් විශ්ලේෂණාත්මකව අධ්‍යයනයට ලක් කෙරේ.

කෞටිල්‍යගේ අර්ථශාස්ත්‍රයට අනුව රාජ්‍යයේ අභිවෘද්ධිය රඳා පවතිනුයේ ආර්ථිකමය සාධකය මතයි. (අර්ථශාස්ත්‍රය, (1) (2003), පිටු. 7, 8) සංස්කෘත උපදේශ කාව්‍යයක් වන හිතෝපදේශය පෙන්වා දෙන ආකාරයට ලෝකයෙහි සියලු තන්හි සියලු කල්හි බලවත් බවට පත්ව ඇත්තේ ධනය ඇති පුද්ගලයන් ය. 'එය එසේම' යැයි අවධාරණය කරන තත් ග්‍රන්ථය රජවරුන්ගේ අධිපතිකම පවා ධනය මුල් කොට ගෙන සිදුවන්නේ යැයි පෙන්වා දී තිබේ.' (හිතෝපදේශය, (මිත්‍රලාභය) ((1993), ශ්ලෝක 123) පාලකයා ධනවතෙක් විය යුතුමයි. එසේ නොවන

ධන හීන පාලකයා ඔහු වටා සිටින බලවත් නිලධාරීන් විසින් මෙන්ම පිරිවර ජනයා විසින් ද අත්හරිනු ඇත. ධනහීන තැනැත්තා ඔහුගේ බිරිඳ විසින් ද අත්හරිනු ලබන්නේ නම් ඉදින් අන් අය එවැන්නන් අත්හැර දමන්නේ ය යන්න කියනු ම කවරේ ද.?

> *''කිං චානෛ්‍යර්න කුලාචාරෛඃ සේව්‍යතාමේති පුරුෂඃ*
> *ධනහීනඃ ස්වපත්න්‍යාපි ත්‍යජ්‍යතේ කිං පුනඃ පරෛඃ''* (හිතෝපදේශය, (සුහෘද්භේදය) (1996),

ශ්ලෝක 93) යන මෙම සඳහනින් පෙන්වා දෙනුයේ ධනහීන පාලකයා දේශපාලන ලෝකයේදී දුබලයෙක් වන ආකාරය සහ සිය සමීපතමයන් ඉදිරියේ අසරණ වන ආකාරය යි. දේශපාලන බලය ධනය නම් සාධකය මත ගොඩනැඟෙන ඒකකයක් වන බැවින් එය වර්ධනය කරගැනීමට පාලකයා අවධානය යොමු කළ යුතු ය. ධනහීනයා ඔහුගේ බිරිඳ විසින් ද අත්හරිනු ලබන්නේ නම් දේශපාලන ලෝකය තුළ ධන හීන පාලකයාට කවර පිළිගැනීමක් ද? කවර බලයක් ද? ධනයත් නැති බලයත් නැති දේශපාලන චරිත කවරකු විසින් ඇසුරු කරන්නේ ද.? ඔහුගෙන් ප්‍රයෝජන ඇත්තේ කවරකුට ද.? දේශපාලන ලෝකය තුළ ධනවත් බව වර්ධනය කරගැනීමට රාජ්‍ය භාණ්ඩාගාරය ශක්තිමත් කරගැනීම කෙතරම් වැදගත් ද යන්න මෙයින් පැහැදිලි කරගත හැකි ය. 'රජුගේ භාණ්ඩාගාරය ප්‍රාණයෝ ය. අනෙක් සජීවී ප්‍රාණයෝ ප්‍රාණයෝ නොවෙති.' *''....කෝශඃ කෝශවතඃ ප්‍රාණාඃ ප්‍රාණාඃ ප්‍රාණා න භූපතේඃ''* (හිතෝපදේශය, (සුහෘද්භේදය), (1996), ශ්ලෝක 92) යන මූලාශ්‍රය විස්තරයෙන් ද ප්‍රකට කරනුයේ පාලකයකුට සිය බලය වර්ධනය කරගැනීම සඳහා භාණ්ඩාගාරය කොතරම් වැදගත් ද යන්නයි. සජීවී ජීවිතයකට වඩා අප්‍රාණ වූ භාණ්ඩාගාරය රජුට වැදගත් යැයි කීමෙන් ප්‍රකට කරනුයේ රජුට මෙන්ම රාජ්‍යයට භාණ්ඩාගාරය කොතරම් වැදගත් ආයතනයක් ද යන්නයි. මෙයින් වඩාත් පැහැදිලි වනුයේ කිසියම් රාජ්‍යයක භාණ්ඩාගාරය ආර්ථිකමය අතින් ශක්තිමත් නම් පාලකයා හා තත් රාජ්‍යය බලයෙන් ආඪ්‍ය වන බවයි.

රාජ්‍ය භාණ්ඩාගාරය භාරදිය යුතු පුද්ගල චරිත

සමස්ත රාජ්‍ය සංවිධානයේ ම අනාගතය භාණ්ඩාගාරය මත රැඳී පවතින බැවින් එහි භාරකාරිත්වය කවර තැනැත්තෙක් කෙරෙහි ලබා දෙන්නේ ද යන්න පිළිබඳව වඩාත් සැලකිලිමත් විය යුතු බව භාරතීය මූලාශ්‍රය අවධාරණය කර තිබේ. සක්කයක සහායකින් තොරව රෝදවලට දිගු ගමනක් යාමට නොහැකි වන්නා සේ භාණ්ඩාගාරයේ දායකත්වයකින් තොරව රාජ්‍යයට ද ඉදිරියට ගමන් කළ නො හැකි ය. ඉදින් රාජ්‍ය භාණ්ඩාගාරය කිසියම් ආකාරයකින් විනාශ වන්නේ නම් එවිට රජුගේ බලය ද විනාශ වන බැවින් එහි ශක්තිය හීන වීමට කිසිසේත් ඉඩ නොතැබිය යුතු බව මහාභාරතය අවධාරණය කර තිබේ. (මහාභාරතය, (ශාන්ති පර්වය) 130: ශ්ලෝක 12)

භාණ්ඩාගාරයේ භාරකාරිත්වය දරන තැනැත්තා බුද්ධිමත් තැනැත්තෙක් විය යුතු අතර ම ඔහුගේ බුද්ධිය විනයෙන් පිරිපුන් එකක් ද විය යුතු ය. එසේම ඔහුගේ චරිතය තුළින් උතුම් ශ්‍රේෂ්ඨ බවකුත් හැසිරීම් රටාවෙන් තේජසත් ප්‍රකට කළ යුතු ය. රාජ්‍ය තන්ත්‍රයේ වඩාත් භාරධුර ම කාර්යය තම උර මත පැවරී ඇති බැවින් තමන් තුළ කිසිම කරුණක් නිසාවත් හීන නොවන ධෛර්යමත් බවකුත්, සෑම තන්හීම ප්‍රකට කළ යුතු ඉවසීමකුත්, අන්‍යයන්ට වඩා පිවිතුරු බවකුත්, අනුරාගික බවකුත් ඔහු විසින් ප්‍රකට කළ යුතු බව මහාභාරතය අවධාරණය කර තිබේ. මීට අමතරව රාජ්‍ය නීතිය පිළිබඳ මනා දැනුමකුත්, ආර්ථික ක්ෂේත්‍රය පිළිබඳ මනා ධාරණ ශක්තියකුත් ඔහු තුළින් විද්‍යමාන විය යුතුයි. මෙවැනි කරුණු කෙරෙහි වඩාත් සැලකිලිමත්ව ඔහුගේ සියලු ගුණයන් හැමකල්හී ම පරීක්ෂා කොට, ප්‍රෞඪත්වයෙන් යුතු, කපටි බවෙන් තොර, පස්දෙනකු මුදල් ඇමැති තනතුරට පත් කළ යුතු බව මහාභාරතයේ සඳහන්ව ඇත. (මහාභාරතය, (ශාන්ති පර්වය 1 කොටස), (2006), 84: පි. 241)

ඉහත මූලාශ්‍රය විස්තරය තුළින් ප්‍රකට වන වැදගත් කරුණ වනුයේ භාණ්ඩාගාරය පිළිබඳ පාලනය එක් අයකුට පමණක් භාර නොදී කිහිප දෙනකු අතට පත් කළ යුතු බව ය. භාණ්ඩාගාරය වැනි ආයතනයක පාලනය හුදෙකලා පුද්ගලයෙක් මත පැවරූ කල ඔහුගෙන් ධනය පිළිබඳ පුද්ගල අගතිගාමිත්වය ඉස්මතු විය හැකි ය. ධනය පිළිබඳ එම අගතිගාමිත්වය ආර්ථික ක්ෂේත්‍රයට මෙන්ම පාලන සංවිධානයට අයහපත් ලෙසින් බලපානු ඇත. මේ පිළිබඳව සැලකිලිමත් වූ ආචාර්ය භීෂ්ම, ධනය පිළිබඳ භාරකාරිත්වය එක් පුද්ගල සාධකයක් මත පදනම් නොවී එය කණ්ඩායමක් අතට පත්කිරීමට කටයුතු කළ යුතු යැයි අවධාරණය කර ඇත. මෙයින් ධනය පිළිබඳ පුද්ගල අගතිගාමිත්වය සීමා කරන්නට ඇතැයි කල්පනා කළ හැකි ය.

භාණ්ඩාගාරයේ ප්‍රධානියා පිළිබඳව අදහස් දක්වන ශුක්‍රාචාර්ය තෙමේ, සිය දේශය පිළිබඳව මෙන්ම කාලත්‍රය පිළිබඳව අවබෝධයක් තිබෙන, අයවැය පිළිබඳව මනා දැනුමක් ඇති තැනැත්තාට (සුමන්ත්‍රට) භාණ්ඩාගාරය භාරදිය යුතු යැයි අවධාරණය කර තිබේ.

''දෙශකාලප්‍රවිඥාතාහ්‍යමාත්‍යඉතිකථ්‍යතෙ ආයව්‍යයප්‍රවිඥාතාසුමංත්‍රඃසවකීර්තිතඃ'' (ශුක්‍රනීති, (1952), 2ඃ ශ්ලෝක 85) මෙයින් පැහැදිලි කරනුයේ අතීත, වර්තමාන හා අනාගත යන කාලත්‍රයේ ම සිය දේශයේ අය හා වැය පිළිබඳ හොඳ දැනුමක් මෙන්ම තුලනයක් ඇති තැනැත්තාට භාණ්ඩාගාරය භාරදිය යුතු බව ය. රාජ්‍යයට ලැබෙන අය ප්‍රමාණය හා වැය ප්‍රමාණය පිළිබඳ හොඳ දැනුමක් ඇති තැනැත්තාට භාණ්ඩාගාරය හැසිරවීමේ හැකියාවක් ඇති බව මෙයින් කියැවේ. මේ පිළිබඳව තවදුරටත් කරුණු ඉදිරිපත් කරන ශුක්‍රාචාර්ය තෙමේ ඉඳුරන් දිනූ (ඉඳුරන් පිනවීමට ආශාවක් නැති), ධනවත් (ආර්ථිකමය අතින් ශක්තිමත්), ව්‍යවහාරය දත් (ලෝක ස්වභාවය පිළිබඳව අවබෝධය ඇති), සිය පණටත් වඩා ධනය ම ප්‍රාණය කොට ජීවත් වන, අතිශයින් මසුරු පුද්ගලයකු ම භාණ්ඩාගාරයේ අධ්‍යක්‍ෂක තනතුරට පත් කළ යුතු යැයි පෙන්වා දී තිබේ.

''... දාංතස්තුසධනොයස්තු ව්‍යවහාර විශාරදඃ - ධනප්‍රාප්ණොති කෘපණඃ කොශාධ්‍යක්ෂඃ සඑවහි'' (ශුක්‍රනීති, (1952), 2ඃ ශ්ලෝක 151) ශුක්‍රාචාර්ය තෙමේ පෙන්වා දෙන ආකාරයට භාණ්ඩාගාරය භාරදිය යුතු වන්නේ ඉඳුරන් දිනූ, ව්‍යවහාර නීතිය පිළිබඳ අවබෝධයක් ඇති, ධනය සිය ප්‍රාණය හා සමාන කොට සලකන, ධනවත් බවින් යුතු මසුරු අයකුට ය. ධනවත් වූත් මසුරු වූත් තැනැත්තා හිතු මතේ ධනය වියදම් කිරීමට හෝ පරිත්‍යාග කිරීමට පෙළඹෙන්නේ නැති බැවින් එවැනි අයෙක් අතට භාණ්ඩාගාරය පත්කිරීම වඩාත් උචිත බව මෙයින් කියැවේ. ආචාර්ය භීෂ්මට අනුව ලොල් වූවන් (ස්ත්‍රීන් හා සුරාව වැනි දේට) හා මෝඩ පුද්ගලයන් අර්ථ කාර්යයන්හී නොයෙදිය යුතු ය. මේ පිළිබඳව තවදුරටත් කරුණු දක්වන භීෂ්ම තෙමේ කිසියම් අයෙක් ලෝභත්වයෙන් තොරව කටයුතු කරන්නේ ද, හෙතෙම බුද්ධිමත් බවින් යුක්ත ද ඉදින් ඔහු අර්ථ කාර්යයේ යෙදවිය යුතු යැයි පෙන්වා දී තිබේ. (මහාභාරතය, (ශාන්ති පර්වය) 71ඃ ශ්ලෝක 8, 9) මෝඩ තැනැත්තන් ධනය සංග්‍රහ කිරීමට යෙදවුවහොත් ඔහු අනුචිත උපායවලින් ප්‍රජාවට කරදර කරනු ඇත. එසේ හෙයින් එවැන්නන් තත් කාර්යයන්හී නොයෙදීමට රජු වග බලාගත යුතු ය. ශුක්‍රචාර්ය සඳහන් කළ ආකාරයට භාණ්ඩාගාරය භාරදිය යුතු වන්නේ අයවැය පිළිබඳ අවබෝධයක් ඇති ධනය ප්‍රාණය කොට ඇති මසුරකුට ය. භීෂ්ම පෙන්වා දෙන ආකාරයට ධනයට ලොල් වූ මෝඩ පුද්ගලයන්ට කිසිදු අවස්ථාවක භාණ්ඩාගාරය භාර නොකළ යුතු ය.

භාණ්ඩාගාර අධ්‍යක්‍ෂක තනතුර කවර අයකුට භාරදිය යුතු ද යන්න පැහැදිලි කරන කෞටිල්‍ය, පිටතින් හා ඇතුළතින් ලැබෙන ආදායම පිළිබඳව මනා දැනුමක් ඇති, වර්ෂ සියයකට පෙර ආදායම පිළිබඳව විමසුවහොත් ඒ පිළිබඳව ද තත්කාලයේ ගණන් පිළිබඳව මෙන්ම අතීතය පිළිබඳ ස්මරණ ශක්තිය ද තිබෙන, ගණන් හිලවු පැහැදිලිව ලේඛනගත කිරීමේ හැකියාව තිබෙන තැනැත්තා භාණ්ඩාගාරයේ ප්‍රධානිය ලෙස පත් කළ යුතු යැයි පෙන්වා දී තිබේ. (අර්ථශාස්ත්‍රය, (අධිකාර2), (2003), 5ඃ ශ්ලෝක 22) කෞටිල්‍ය පෙන්වා දෙන ආකාරයට භාණ්ඩාගාරය භාරදිය යුතු වන්නේ කාලත්‍රයේ ම ආර්ථික හැසිරවීම පිළිබඳව අවබෝධය තිබෙන, ආදායම් හා වියදම් වාර්තා නිවැරදි ලෙස වාර්තා කරමින් කටයුතු කරන පුද්ගලයාට ය. භාණ්ඩාගාරය භාරගැනීමේදී පුද්ගලයාගේ චරිත ලක්‍ෂණවලට වඩා ආර්ථිකය හැසිරවීමේ හැකියාව කෞටිල්‍යගේ ඇගයීමට ලක්ව ඇති බවක් පෙනී යයි.

යාඥවල්ක්‍ය ඍෂිවරයාගේ අදහසක් උපුටා දක්වන හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමියන් පෙන්වා දෙනුයේ ආර්ථිකය පිළිබඳ සුදුසුකම් සැපිරූ, ඒ පිළිබඳව දක්ෂතා දක්වන, උගත්, පිවිතුරු චරිත ලක්‍ෂණ ඇති අය භාණ්ඩාගාරයේ එසේත් නැති නම් අය වැය පිළිබඳ කාර්යයන්හී දී ප්‍රධානීන් ලෙස පත්කළ යුතු බව ය. (පඤ්ඤාකිත්ති හිමි, (2001), පි. 209) මෙයින් පැහැදිලි වනුයේ මුදල් පරිහරණයේදී සිදුවන වංචනික ක්‍රියාවන් නවතාලීම සඳහා ඉහත සඳහන් ගුණාංගවලින් පිරිපුන් නිලධාරීන් භාණ්ඩාගාරයේ ප්‍රධානීන් ලෙස පත් කරගත යුතු බව ය. භාණ්ඩාගාරයේ ප්‍රධානීන් ලෙස පත්කරගනු ලබන නිලධාරීන් කවර ගුණාංග හා ගතිලක්‍ෂණවලින් සමන්විත විය යුතු ද යන්න භාරතීය මූලාශ්‍රය දක්වන තොරතුරුවල කිසියම් විවිධත්වයක් දක්නට ලැබෙන නමුත් දක්‍ෂ, උගත්, පවිත්‍ර, අය වැය පිළිබඳ අවබෝධය තිබෙන, ධෛර්යවන්ත බව හා ඉවසීම වැනි ගුණාංගවලින් මෙන්ම විවිධ කුසලතාවන්ගෙන් සමන්විත අයට එය භාරදිය යුතු ය යන්න පොදු ලක්‍ෂණ ලෙස හඳුනාගත හැකි ය.

භාණ්ඩාගාර ප්‍රධානියාගේ කාර්යභාරය

භාණ්ඩාගාර ප්‍රධානියා පිළිබඳව තවදුරටත් අදහස් දක්වන ශුක්‍රාචාර්ය තෙමේ 'භාණ්ඩාගාරය භාරගත් තැනැත්තා රජයේ ඉඩම් කෙතරම් ප්‍රමාණයක් වෙයි ද, කෙතරම් ඉඩම් ප්‍රමාණයක් වගාකර ඇති ද, එම වගා ඉඩම්වලින් රාජ්‍ය භාගය වශයෙන් (බදු) කෙතරම් ප්‍රමාණයක් රජයට ලැබේ ද, කෙතරම් ද්‍රව්‍ය ප්‍රමාණයක් හා තෘණවර්ග මේ වර්ෂයේදී එකතු කරන ලද ද, කෙතරම් වැය වීම් සිදු වී තිබේ ද, කෙතරම් ඉතිරිව තිබේ ද, ස්ථාවර ගස් ආදිය කොපමණ ද, ජංගම සතුන් කොපමණ ද' යනාදි වූ කරුණු පිළිබඳව මනා අවබෝධයකින් පසුවිය යුතු බවත් ඔහු මේ සියල්ල රජුට දැනුවත් කළ යුතු බවත් පෙන්වා දී තිබේ. *''ඉයච්චසංචිතංද්‍රව්‍යංවත්සංරොස්මින්තෘණාදිකං - ව්‍යයීභූතමියච්චෛවශෙෂංස්ථාවරජංගමං''* (ශුක්‍රනීති, (1952), 2ඃ ශ්ලෝක 101) ඉහත මූලාශ්‍රය පෙන්වා දෙන

ආකාරයට භාණ්ඩාගාරය භාරගන්නා තැනැත්තාට ආර්ථික ක්ෂේත්‍රයට අදාළව සෘජුව හා වක්‍රව දායකත්වය සපයන සෑම ක්ෂේත්‍රයක් කෙරෙහි ම පුළුල් අවබෝධයක් තිබීම වැදගත් ය.

භාණ්ඩාගාරය සම්බන්ධ සමස්ත කාර්යයන් 'සන්නිධාතා' (භාණ්ඩාගාරාධ්‍යක්ෂ) යටතේ තැබිය යුතු බව කෞටිල්‍යගේ අදහසයි. භාණ්ඩාගාර ප්‍රධානියාගේ අධිකාරිත්වය යටතේ භාණ්ඩාගාරය විකුණන භාණ්ඩ තබන තැන (පණ්‍යගෘහ), අනුභව කළ යුතු දෑ තබන තැන (කෝෂ්ඨාගාර), ඛනිජ ද්‍රව්‍ය (කුප්‍යගෘහ), ආයුධගෘහය (ශස්ත්‍රාගාර) බන්ධනාගාරය (කාරාගෘහ) ආදී මේ කියනු ලබන ස්ථානවල කටයුතු සොයා බැලිය යුතු ය. කෞටිල්‍ය පෙන්වා දෙන ආකාරයට මේ සියලු කාර්යයන් සොයා බලා කටයුතු කිරීම සන්නිධාතා හෙවත් භාණ්ඩාගාරාධ්‍යක්ෂකට අයත් කාර්යයන් ය.

''සන්නිධාතා කොශගෘහං පණ්‍යගෘහං කොෂ්ඨාගාරං
කුප්‍යගෘහමායුධාගාරං බන්ධනාගාරං ච කාරයේත්'' (අර්ථශාස්ත්‍රය, (අධිකාර 2), (2003), 5: ශ්ලෝක 1)

භාණ්ඩාගාර ප්‍රධානියාගේ කාර්යභාරයන් පිළිබඳව අවධානය යොමු කරන භාරතීය සාහිත්‍ය මූලාශ්‍රය, භාණ්ඩාගාරය සතු දෑ පැහැර ගැනීමක් හෝ විනාශ කිරීමක් හෝ කිසියම් අයකු විසින් සිදු කළහොත් නියත වශයෙන් ම ඒ බව භාණ්ඩාගාරභාර අධ්‍යක්ෂකවරයා විසින් පාලකයාට දැන්විය යුතු යැයි අවධාරණය කර තිබේ. ඉදින් ඔහු එම හෙළිදරව්ව සියල්ලන් ඉදිරියේ සිදු කරන්නේ නම් ඔහු මන්ත්‍රීන්ගෙන් ආරක්‍ෂා කිරීමට රජතුමා කටයුතු කළ යුතු බවත් තත් මූලාශ්‍රය අවධාරණාත්මකව සිහිපත් කෙටෙ තිබේ. මෙයාකාර වූ ආරක්‍ෂක මුක්තියක් ඔහුට ලබාදීමට කටයුතු කරන්නට ඇත්තේ රාජ්‍යය සතු ධන සම්පත් පැහැර ගන්නා මන්ත්‍රීවරු රහස් හෙළිකළ තැනැත්තන් මරා දැමීමට උත්සාහ කිරීම සැලකිල්ලට ගෙන විය යුතු ය.

භාණ්ඩාගාරය ශක්තිමත් කරගැනීම හා එය ආරක්‍ෂා කරගැනීමත් එයට බදු මුදලින් දායකත්වය ලබා දෙන පුද්ගල කණ්ඩායම් ආරක්‍ෂා කිරීමත් රජුට පැවරුණු තවත් වැදගත් කාර්යභාරයකි. සිය රාජ්‍යය තුළ කිසියම් අයකු ධනය රැස් කරන්නේ නම් රජු විසින් ඔහුව හැමකල්හී ම ආරක්‍ෂා කළ යුතු යැයි සඳහන් කර ඇත්තේ එබැවිනි. රාජ්‍ය භාණ්ඩාගාරය ආරක්‍ෂා කරන්නා රක්‍ෂා නොකළහොත් එය මංකොල්ලකන තැනැත්තා භාණ්ඩාගාරය ආරක්‍ෂා කරන්නා නිතර පීඩාවට පත්කරයි. රජුගෙන් ඔහුව ආරක්‍ෂා නොවුවහොත් ඔහු මරා දමනු ඇත. ක්ෂේමදර්ශී මුනිවරයා හා ඔහුගේ මිතුරු කපුටාගේ කථාව තුළින් නිරූපණය කරනුයේ මෙවැනි අවස්ථාවකි. (මහාභාරතය, (ශාන්ති පර්වය 1 කොටස), (2006), 83: පිටු. 234, 235) එහි සඳහන් කථා සිද්ධියට අනුව කෞශල්‍ය රජුගේ භාණ්ඩාගාරය හොරාකන ඔහුගේ මන්ත්‍රීන් පිළිබඳ කරුණු කපුටා විසින් හෙළි කළ නිසා මුනිවරයා නිදිගත් විට සොරා කෑ මන්ත්‍රීවරු එකතු වී හියකින් විද කපුටා මරා දමන ලදි. එවැනි තත්ත්වයන් රාජ්‍ය සංවිධානය තුළ ඇතිවීමේ අවකාශය පදනම් කරගෙන තොරතුරු ලබාදෙන්නාට පාලකයා විසින් ආරක්‍ෂාව ලබාදිය යුතු ය යන අදහස ඉදිරිපත්ව ඇති ආකාරයක් මෙයින් පැහැදිලි කරගත හැකි ය. රාජ්‍ය භාණ්ඩාගාරය සතු දෑ කොල්ලකන රාජ්‍ය සේවකයෝ ප්‍රජාවගේ යහපත කැමැත්තෝ නොවෙති. එනිසා එවැනි රාජ්‍ය සේවකයන් පිළිබඳව නිතර සෝදිසියෙන් පසුවීම පාලකයා සතු වගකීමක් බව මෙයින් පැහැදිලි කෙරේ.

බදු එකතු කරගැනීම පිළිබඳව භාරතීය මූලාශ්‍රය දක්වන අදහස්

පාලකයකුට පුරවැසියන්ගෙන් අයබදු ගැනීමකින් තොරව රටක් පාලනය කළ නො හැකි වනුයේ එය රජයට ආදායම් ලැබෙන ප්‍රධාන මූලය වී ඇති බැවිනි. මේ පිළිබඳව සැලකිලිමත් වන පාලකයා භාණ්ඩාගාරය ශක්තිමක් කරගැනීමට ඉතා සංවිධිත බදු ප්‍රතිපත්තියක් මෙන්ම බදු එකතු කරගැනීමේ කාර්යක්‍ෂම වූ කාර්යපටිපාටියක් ද ක්‍රියාවට නැංවිය යුතු ය. රාජ්‍ය භාණ්ඩාගාරයේ ශක්තිය රඳා පවත්නේ එයට ගලා එන විවිධ බදු වර්ගවලිනි. රජය විසින් අනුමත කොට ඇති, විවිධ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පනවා ඇති බදු ඉතා සංවිධිත ක්‍රමවේදයක් ඔස්සේ වාරික වශයෙන් හෝ වෙනත් ක්‍රමවේදයකින් හෝ භාණ්ඩාගාරයට එකතු කරගැනීමට කටයුතු කළ යුතු ය. එය ඉතා සංවිධිත ලෙස කාර්යක්‍ෂමව සිදු නොවන්නේ නම් භාණ්ඩාගාරය ශක්තිමත් වන්නේ නැත. මේ සම්බන්ධයෙන් ද පාලකයා දැඩි අවධානයකින් කටයුතු කළ යුතු බව භාරතීය සාහිත්‍ය මූලාශ්‍රය නිරීක්‍ෂණය කිරීමේදී පෙනී යයි.

භාණ්ඩාගාරය ශක්තිමත් කරගැනීමේ කාර්යභාරය පැවරී ඇත්තේ රාජ්‍ය භාරය හෙවත් බදු එකතු කරන නිලධරයන්ට ය. එම නිලධරයා සම්බන්ධයෙන් කෞටිල්‍ය දක්වන අදහස්වලට අනුව 'බදු එකතු කරනු ලබන නිලධරයාට (සමාහර්තා) ආදායම පිළිබඳ මනා දැනුමක් මෙන්ම ඒ පිළිබඳව සැලකිල්ලත්, ධනය එකතු කිරීම පිළිබඳව මනා අවබෝධයකුත් තිබිය යුතු ය. ඊට අමතරව බදු එකතු කිරීමේ අධිකාරියා හෙවත් සමාහර්තා 'බලකොටු, රාෂ්ට, ඛනිජ, හේදඬු, කැලෑ (වජ්‍ර), ව්‍යාපාරික මාර්ග' ආදිය පිළිබඳ මනා නිරීක්‍ෂණයක යෙදෙමින් ධනය එකතු කරගැනීමට අවධානය යොමු කළ යුතු බව කෞටිල්‍යගේ අදහසයි. *''සමාහර්තා දූර්ග රාෂ්ට්‍රංඛනිං සෙතුං වනං ව්‍රජං වණික්පථං චාවෙක්ෂෙත''* (අර්ථශාස්ත්‍රය, (අධිකාර 2), (2003), 6: ශ්ලෝක 1) ඉහත සඳහන් කළ ආකාරයට පාලකයා ඉතා ඥානාන්විතව, ධාර්මිකව, භාණ්ඩාගාරයට ධනය රැස්කිරීමට අවධානය යොමු කළ යුතු ය. විශේෂයෙන් ම ධනය රැස්කිරීමේදී ලෝභ රහිත බුද්ධිමත් පුද්ගලයන් ම සියලු කාර්යයන්හී නියුක්ත කිරීම

සුදුසු තත්ත්වයකි. එසේ කටයුතු කළ යුතු වන්නේ මන්ද ? එයට හේතුව වෙනකක් නොව කාර්යාකාර්ය ඥානයෙන් තොර මෝඩයා ධනයේ අධිකාරි වීමෙන් කාම - ද්වේෂයේ වසඟයට ගොස් ප්‍රජාවට පීඩා සිදු කරනු බැවිනි. (මහාභාරතය, (ශාන්ති පර්වය 1 කොටස), (2006), 72ඃ පිටු. 207, 208)

බදු එකතු කරන නිලධාරීන් පිළිබඳව සැලකිලිමත් වන්නා සේම රජය බදු එකතු කරගන්නේ ඇයි ද යන්නත් මහජනයා දැනුවත් කළ යුතුව ඇත. ඒ පිළිබඳව පැහැදිලි අවබෝධයක් රජය හා පුරවැසියා අතර තිබිය යුතු ය. බදු එකතු කරගන්නේ ඇයි ද හා ඒවා කෙසේ විදයම් කරන්නේ ද යන්න පිළිබඳව පුරවැසියාට අනවබෝධයක් ඇති කල්හි බදු ගෙවීම් පැහැර හැරීමටත් බදු ගෙවීමට මැලිකමත් දක්වනු ඇත. මහාභාරතය පෙන්වා දෙන ආකාරයට 'රජු සිය රටවැසියන්ගෙන් ධනය රැස්කර ගත යුතු වන්නේ විපත් කාලයේ පරිභෝගය සඳහා ය.' (මහාභාරතය, (ශාන්ති පර්වය 1 කොටස), (2006), 88ඃ පි. 251) යනුවෙන් මහාභාරතය කරනු ලබන විග්‍රහයෙන් පාලකයා අයබදු අයකරගත යුතු වන්නේ ඇයිද යන්න පැහැදිලි කරගත හැකි ය.

භාණ්ඩාගාරය ශක්තිමත් කරගැනීම සඳහා පාලකයා කටයුතු කළ යුතු වන්නේ කෙසේද යන්න පැහැදිලි කරන තත් මූලාශ්‍රය, නිර්ජල ස්ථානයක හාරා ජලය ලබා ගැනීමට උත්සාහ කරන්නාක් මෙන් රජු උවදුරු කාලයේ නිර්ධන ප්‍රජාවන්ගෙන් ද භාණ්ඩාගාරයට අවශ්‍ය කරන දෑ රැස් කළ යුතු බවත්, අවස්ථාවට අනුව පෙර පීඩාවට පත් ප්‍රජාව මත එම ධනයෙන් කරුණාව දැක්විය යුතු බවත් පෙන්වා දී තිබේ. (මහාභාරතය, (ශාන්ති පර්වය 1 කොටස), (2006), 128ඃ පි. 357)

ඉහත සඳහන් කළ මූලාශ්‍රය පෙන්වා දෙන ආකාරයට ධන හීන පාලකයාට කිසිවෙක් ගරු කරන්නේ හෝ ආදරයෙන් වැළඳ ගැනීමක් හෝ සිදු කරන්නේ නැත. ඉදින් එබඳු තැනැත්තකුට රාජ්‍යභාරය ඉදිරියට ගෙනයාම අපහසු කාර්යයක් වන බැවින් තමාට ඉතා අපහසු කාලයක් එළඹ තිබෙන අවස්ථාවකදී නිර්ධනයාගෙන් වුව බදු ගෙන භාණ්ඩාගාරය ශක්තිමත් කරගැනීමට කටයුතු කළ යුතු ය යන්න මෙහි එන ඉගැන්වීමයි. මෙයාකාරයෙන් කරනු ලබන නිර්දේශයෙන් පෙන්නුම් කරනුයේ ජනයාගේ බදු මුදල් භාණ්ඩාගාරයේ ප්‍රධාන ආදායම් මාර්ගය වී තිබුණු බවත් එය කෙසේ හෝ වර්ධනය කරගැනීමට කටයුතු කළ යුතු බවත් ය.

විපත් කාලයක් එළඹ තිබෙන අවස්ථාවකදී පාලකයා සියලු අපහසුතා මගහරවා ගනිමින් ධනය උදෙසා සියලු ආකාරයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමට පෙළඹෙන්නේ යම්සේ ද එසේ රජුට විපතක් පැමිණි විට රටේ ප්‍රජාව සියලු ම ආකාරයෙන් පාලකයා ආරක්ෂා කළ යුතු ය. භාණ්ඩාගාරය, දඬුවම, බලය, මිත්‍රයන් හා වෙනත් වස්තු රැස් කිරීම පාලකයා විසින් අනිවාර්යයෙන් ම සිදු කරන කාර්යයන් වන බැවින් එවැනි දෑ රජු බඩසයින් පීඩා වුවද රාජ්‍යය උදෙසා දුරු නොකළ යුතු ය. මිනිසා තමාගේ භෝජනය උදෙසා රැස් කළ ආහාරවලින් බීජ සඳහා කිසියම් ප්‍රමාණයක් ඉතිරි කරගත යුතු යි. .... භාණ්ඩාගාරය හා සේනාව රජුගේ එක ම මූලයයි. එසේ ම භාණ්ඩාගාරය ම සේනාවේ මූලයයි. සේනාව සියලු ධර්ම ආරක්ෂා කරන මූලයයි. එම නිසා සියල්ලේ ම මූලය වූ භාණ්ඩාගාරය වර්ධනය කිරීම උචිත වෙයි. අනුන්ට පීඩා නොකිරීමෙන් භාණ්ඩාගාරය රැස් කළ නො හැකි වෙයි. එසේ නම් ධනය සංග්‍රහ නොකොට සේනා සංග්‍රහය කෙසේ සිදුවිය හැකි ද? එම නිසා උවදුරු කාලයේ භාණ්ඩාගාරය රැස් කිරීම උදෙසා ජනතාවට පීඩා කිරීමෙන් රජුට දෝෂයක් ඇති නොවේ. (මහාභාරතය, (ශාන්ති පර්වය 1 කොටස), (2006), 128ඃ පි. 359) ආදී වශයෙන් රජු ධනය රැස් කිරීමට හා එය ආරක්ෂා කිරීමට කටයුතු කළ යුතු ආකාරයත් අපහසු ම අවස්ථාවලදී ජනයාට පීඩා ගෙන දෙමින් වුව ධනය රැස්කිරීමට පෙළඹිය යුතු ආකාරයත් පැහැදිලි කොට තිබේ. ජනතාවට පීඩාවක් ඇතිවන ආකාරයෙන් ධනය රැස් කරමින්, මහජනයාට ඔරොත්තු නොදෙන ආකාරයෙන් ඔවුන් මත අධික බදු බර පැටවීම අනුමත නොකරන නමුත් රටේ ආරක්ෂා සංවිධානය ශක්තිමත් කිරීමේ අපේක්ෂාව පෙරදැරි කරගෙන ජනයා කෙරෙහි පීඩනයක් ඇති වන ලෙස ධනය රැස්කිරීම රජුගේ දෝෂයක් නොවන බවත් මෙයින් අවධාරිත ය.

භාණ්ඩාගාරයට ධනය රැස්කර ගත යුතු වන්නේ කෙසේ ද? යන්න පිළිබඳව උපදෙස් දෙන මහාභාරතය 'සාම, දාන හා භේද' යන තෙවැදෑරුම් වූ උපාය මාර්ගවලින් ම ධනය රැස් කළ යුතු බව පෙන්වා දී තිබේ. මේ කියනු ලබන ක්‍රමවේදවලින් යම් ධනයක් ලැබෙන්නේ ද විද්වත් රජු එයින් සතුටට පත්විය යුතු බව බෘහස්පතීගේ ද අදහස වී තිබේ. (මහාභාරතය, (ශාන්ති පර්වය 1 කොටස), (2006), 69ඃ 200)

පාලකයා ප්‍රජාවගෙන් අයබදු රැස්කර ගත යුතු වන්නේ කුමක් සඳහා ද ?. යන්න පිළිබඳව අවධානය යොමු කරන භාරතීය සාහිත්‍ය මූලාශ්‍රය කරුණු දෙකක් ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබේ. එම කරුණු අතුරින් පළමු වැන්න වනුයේ ප්‍රජාව වෙත සුබසාධන ක්‍රියාවලිය ක්‍රියාවට නැංවීමයි. දෙවැන්න වන්නේ මහජනයාගේ හා රාජ්‍යයේ ආරක්ෂාව සුරක්ෂිත කිරීමය. සුභසාධන ක්‍රියාවලිය බදු අයකර ගැනීමේ එක් අපේක්ෂාවක් වන නමුත් පාලකයාගේ ප්‍රමුඛ කාර්යය විය යුතු වන්නේ ආරක්ෂා සංවිධානය සුරක්ෂිත කිරීමයි. එනිසා බුද්ධිමත් පාලකයෙක් තත් කාර්යය මැනවින් ක්‍රියාවට නැංවීමේ අරමුණින් ප්‍රජාවගේ ආදායමෙන් සයවැනි කොටස බදු වශයෙන් ගත

යුතු බව මූලාශ්‍රය අවධාරණය කර ඇත. සිය පුරවැසියන් ආරක්ෂා කිරීම පාලකයාගේ මුඛ්‍ය කාර්යභාරයක් වන නමුත් කිසිම අවස්ථාවක උන්මත්ත ආදි කොට ඇති දස ධර්මගත පුද්ගලයන්ගෙන් දඬුවම් වශයෙන් ස්වල්ප වූ ධනයක් නමුත් නොගත යුතු යැයි අවධාරණය කර තිබේ. (මහාභාරතය, (ශාන්ති පර්වය 1 කොටස), (2006), 69: පි. 200) පාලකයා අයබදු ගත යුත්තේ ආරක්ෂා සංවිධානය වෙනුවෙන් බව මෙයින් ගම්‍ය වන අතර ගත යුතු ප්‍රමාණය <u>හයෙන් එකක්</u> බව ද මෙයින් පැහැදිලි කෙරේ.

ඉහත සඳහන් කළ ආකාරයට 'සාම, දාන, භේද' යන ක්‍රමවේදවලින් ධනය උපයාගත යුතු නමුත් මත් වූ, උන්මත්තකයින් ආදීන් වෙනුවෙන් පනවනු ලබන දඬුවම්වලින් ධනය උපයා ගැනීමට පාලකයා කිසිසේත් කටයුතු නොකළ යුතු යැයි අවධාරණය කර ඇත. රජු ඉතා නිර්ධන වූයේ නමුත් වේද පාඨ කියන බමුණන්ගෙන් අයබදු නොගත යුතු බව මනුස්මෘතියේ එන සඳහනකින් ද තහවුරු කරගත හැකි ය. (මනුස්මෘතිය සහ මානවශිෂ්ටාචාරය, (2001), 7: ශ්ලෝක 133) මනුට අනුව පූජක පක්ෂය අයබදුවලින් නිදහස් පුද්ගලයන් ය. ඉහත සඳහන් කළ කරුණුවලින් පැහැදිලි වනුයේ පාලකයා ජනතාවගෙන් බදු වශයෙන් ගෙන ඇත්තේ උත්පාදන කොටසෙන් හයෙන් එකක් බව ය. උපන් වස්තුවලින් <u>සයවැනි කොටස</u> අයබදු වශයෙන් ගෙන නීතිශාස්ත්‍රයට අනුව අපරාධකරුවන්ට දැඩි දඬුවම් හා වෙළෙඳුන් ආරක්ෂා කිරීමට කටයුතු කළ යුතු බවත් අවධාරණය කරන මහාභාරතය, වෙළඳ ප්‍රජාවගෙන් බදු අය කරගෙන භාණ්ඩාගාරය ශක්තිමත් කරගත යුතු බවත් මේ සියල්ල ධර්මනීතියට අනුව සිදු කළ යුතු බවත් අවධාරණාත්මකව සිහිපත් කර තිබේ. (මහාභාරතය, (ශාන්ති පර්වය 1 කොටස), (2006), 72: පිටු. 207, 208) මෙම මූලාශ්‍රය පෙන්වා දෙන ආකාරයට පාලකයා අයබදු ගත යුතු වන්නේ අපරාධකරුවන්ට දඬුවම් දීමට හා වෙළඳ ප්‍රජාව ඇතුළු සිය ප්‍රජාව ආරක්ෂා කිරීම සඳහා ය.

අයබදු ගැනීමේදී ඒ ඒ භාණ්ඩවලට අනුරූප වන ලෙස බදු අයකර ගැනීම වැදගත් ය. ඒ අනුව රජු සතුන් හා රත්තරන්වලින් (මූල ධනයට වඩා අධික) සියයට පණහක කොටසක් හා ධාන්‍යවලින් සියයට හයක්, අටක් හෝ දොළොසක් (බිමෙහි සරු බව හා අස්වැන්න, පරිශ්‍රමය ආදිය සලකා) බදු ගත යුතු යැයි අවධාරණය කර ඇත. *''පඤ්චාශද්භාග ආදේයෝ රාඥා පශුහිරණ්‍යයෝඃ - ධාන්‍යානාම<u>ෂ්ටමෝ</u> භාගඃ <u>ෂෂ්ටෝ ද්වාදශ</u> ඒව වා''* (මනුස්මෘතිය සහ මානවශිෂ්ටාචාරය, (2001), 7: ශ්ලෝක 130) බදු අයකර ගැනීම පිළිබඳ නිශ්චිත මිම්මක් එකල නොවූ බවත් එය විවිධ භාණ්ඩවල වටිනාකම මත රඳා පැවති බවත් මෙයින් පැහැදිලි වේ. ඒ අනුව එය හයේ සිට දහය දක්වා බෙදී ගිය බවක් පෙනී යයි. මීට අමතරව ගස්, මල්, පැණි, ගිතෙල්, සුවඳ ද්‍රව්‍ය, ඖෂධ රස (ලුණු ආදිය) මල්, ගෙඩි, පත්‍ර, ශාක, තෘණ, සම්, උණගස් හා මැටි භාජනය, සෙල්මුවා ආදි කොට ඇදි සියලු ද්‍රව්‍යයන්ගෙන් <u>හයෙන් කොටසක්</u> බදු වශයෙන් ගත යුතු යැයි සඳහන් කර ඇත. (මනුස්මෘතිය සහ මානවශිෂ්ටාචාරය, (2001), 7: ශලෝක 131) හයෙන් කොටසක් යනු රාජ්‍යයේ නියමිත බදු ප්‍රමාණය නොවන බවත් එය ඉහත සඳහන් කළ භාණ්ඩ හා විවිධ ද්‍රව්‍ය වෙනුවෙන් නියම කරන ලද ප්‍රමාණයක් බව මෙයින් තහවුරු වේ. මීට අමතරව කෘෂි (සීතා) ධාන්‍යවලින් සයෙන් කොටස (භාග) ප්‍රජාවගෙන් රජු ලබයි. උපහාර ධන බද්ද (බලි) ගංගා තරණය කිරීමෙන් ලබන බද්ධ, නෞකා මඟින් ලබන බදු (පට්ටන), කුඩා නගරවලින් ගන්නා බදු, තෘණබිම්වලින් ගන්නා බදු (විවීත) ලණුවලින් භූමිය මැනීම මඟින් ගන්නා බදු, සොරුන් ඇල්ලීමෙන් ලබා ගන්නා ධනය ආදි වශයෙන් විවිධ ක්ෂේත්‍රයන්ගෙන් බදු ලබාගත යුතු ආකාරය කෞටිල්‍ය විසින් පැහැදිලි කර තිබේ.

''සීතා භාගො බලිඃ කරො වණික් නදීපාලස්තරො - නාවඃ පත්තනං විවීතං වතීනි ....'' (අර්ථශාස්ත්‍රය, (අධිකාර 2), (2003), 6: ශ්ලෝක 3) ඉහත සඳහන් කළ බදුවලට අමතරව පතල්වලින් නොයෙක් ආකාරයෙන් ලැබෙන රුවන්, රිදී, විදුරුමිණි, මුතු, පබලු, සක්, ලෝහ, ලුණු ආදියෙන් ලබෙන 'ඛනිජ' වශයෙන් හැඳින්වෙන ආදායම්, ගෙඩි, මල් සහ ආහාර කෙත්වලින් ලැබෙන 'සේතු' නම් ලාභය, කැලෑ සතුන්, මුවන්, ඉතා වටිනා කැලෑ ලී ආදියෙන් ලැබෙන 'වන' නම් ආදායම, ගොනුන්, බැටලුවන්, ඔටුවන්, බූරුවන්, අශ්වයන් ආදි සියල්ලෙන් ලැබෙන 'ව්‍රජ' නම් ලාභය, ජල හා ගොඩබිම් මාර්ගවලින් ලැබෙන 'වණික්පථ' නම් ලාභය ආදි වශයෙන් විවිධ ක්ෂේත්‍රවලින් රජයට ලබාගත යුතු බදු හා ආදායම් කවරේ ද යන්න කෞටිල්‍ය විස්තර කර තිබේ. එහිදී 'වණික්පථ' රාජ්‍ය ආදායමේ ශරීරය ලෙස ද හඳුන්වා ඇත. (අර්ථශාස්ත්‍රය, (අධිකාර 2), (2003), 6: ශ්ලෝක 4-9)

සිය රාජ්‍යය තුළ විවිධ ද්‍රව්‍ය අලවි කරන, මිලදී ගනු ලබන, ඒ සඳහා වැයවෙන ප්‍රවාහන වියදම, දායකත්වය සපයන කම්කරුවන්ගේ වේතන, ගේ දොර වියදම් ආදිය පිළිබඳව සැලකිලිමත් වෙමින් රජු වෙළෙන්දන්ගෙන් අයබදු ගත යුතු ය. මීට අමතරව විවිධ ශිල්ප ශ්‍රේණිවලින් බදු ගැනීමේදී ඔවුන් විසින් නිෂ්පාදනය කරනු ලබන ද්‍රව්‍යවලට වැයවෙන මුදල්, ශිල්ප කාර්යය, ශ්‍රේණියේ ආර්ථික තත්ත්වය ආදිය පිළිබඳව සැලකිලිමත් විය යුතු ය. එසේ ම යමකින් ප්‍රජාවට දුකක් නොවේ ද, උවදුරට පත් නොවෙයි ද, ඒ පිළිබඳව විමසා බලා ප්‍රජාව මත සුදුසු පරිදි බදු අය කළ යුතු ය. ඵල එනම් ධන ධාන්‍ය හා කර්ම එනම් කෘෂි ආදි කාර්ය පූර්ණ රීතියෙන් බලා ඔවුන් වෙත බදු තීරණය කළ යුතු යි. මේ පිළිබඳව සැලකිලිමත් විය යුතු වන්නේ ඵල හා කර්මවලින් ලැබෙන ආදායම පිළිබඳ නිශ්චිත නිගමනයකට එළඹිය නොහැකි බැවිනි. යම් උපායකින් රජු හා කම්කරුවන් යන දෙපක්ෂය ම

කෘෂි වෙළඳාම ආදි කර්ම ලාභයේ කොටස්කරුවන් වී නම් ඒ පිළිබඳව විමසා බලා බදු අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. අධික ලෝභය නිසා කිසිදු ආකාරයේ විනාශයකට නොයා ප්‍රජාවට සතුට උපදවන ආකාරයේ හැසිරීම් රටාවක් රජු විසින් ප්‍රකට කළ යුතුව ඇත. ඔහු වියලවන්නෙක් යැයි ප්‍රසිද්ධ වූවොත් ඔහුට සියලු දෙනා ද්වේෂ කරනු ඇත. ඉදින් ඔහුට එයින් කිනම් ආකාරයක යහපතක් වේ ද? යමෙක් ප්‍රජාවට ප්‍රිය වෙතොත් ඔහුට සියලු ලාභ ලැබෙයි. යම්සේ මිනිස්සු පැටවා කුසගින්නේ නොතබා දෙනගෙන් කිරි දොවත් ද, එසේ ම බුද්ධිමත් රජු රාජ්‍යය දෙවිය යුතු ය.'

''මධුදොහං දුහෙද් රාෂ්ට්‍රං භ්‍රමරා ඉව පාදපම් - වත්සාපෙක්ෂී දුහෙච්චෛව ස්තනාංශ්ච න විකුට්ටයෙත්'' (මහාභාරතය, (ශාන්ති පර්වය), 89: ශ්ලෝක 4) යනුවෙන් ඉතා සංවිධානාත්මක ලෙස සිය රාජ්‍යය තුළ බදු අයකර ගැනීමේ ක්‍රමවේදය පැහැදිලි කර ඇත. බදු අයකර ගැනීමේදී විවිධ අංශ උපයන ප්‍රමාණය, උපයන ක්‍රමවේදය, වියදම්, ආදයම් ආදි කරුණු පිළිබඳ මනා අවබෝධයක් පාලකයාට තිබිය යුතු බව මෙයින් පැහැදිලි කෙරේ.

සිය ප්‍රජාවගෙන් බදු අයකර ගැනීම කිරි දොවන්නකුට සමවිය යුතු ය. බදු අයකර ගැනීම සම්බන්ධයෙන් දක්වන ලද ඉහත උපමාව අතිශයින් වැදගත් වූවකි. කිරි දොවන්නා පළමුවෙන් පැටවාට කිරි බීමට ඉඩ සැලැස්විය යුතු ය. පැටවා කිරි පානය කිරීමෙන් පසුව අතිරික්ත කිරි ටික දොවාගත යුතු යි. එපරිද්දෙන් මහජනයාට ජීවත්වීමේ ආර්ථික ශක්තිය සලසා දී රජයට අවශ්‍ය හා ගත යුතු අය ප්‍රමාණය ගැනීමට අවධානය යොමු කිරීම වැදගත් ය. අධික ලෙස කිරි දෙවීම නිසා එළදෙන මෙන්ම පැටවා ද පීඩාවට පත්වේ. එපරිද්දෙන් අධික ලෙස අයබදු ගත් කල රට ද දිළින්දන් වීමෙන් ප්‍රජාවට විශාල කර්ම කිරීමට නො හැකි වෙයි. එවැනි තත්ත්වයක් ඇති වීමට අවකාශ නොදී පාලකයා සිය ප්‍රජාව වෙත කරුණාව හා ආදරය දක්වමින් ඔවුන් ආරක්ෂා කළ යුතු ය.

ඉහත සඳහන් කළ ආකාරයට බදු අයකර ගැනීම ඉතා කල්පනාකාරීව කළ යුතු කාර්යයකි. සූක්ෂම උපායශීලී පාලකයකු නම් සිය ප්‍රජාවට නොදැනෙන ආකාරයෙන් බදු අයකර ගනී. ඉදින් රාජ්‍ය භාණ්ඩාගාරය අයබදු මත යැපෙන බැවින් මහජනයාට අවම පීඩාවක් වන ආකාරයෙන් අයබදු ගැනීමට අවධානය යොමු කළ යුතු ය. 'මිනිස්සු උක්ගස් කපා අඹරා රසය ග්‍රහණය කරන්නා සේ මහජනයා පෙළීමට ලක් නොකළ යුතු ය. විශාල තල් හා රටඉඳි ආදි ගස් ආරක්ෂා කොට එහි රසය ග්‍රහණය කරන්නා සේ රජු ද එයාකාරයෙන් ප්‍රජාවගේ අය - වැය බලා ඔවුන් ආරක්ෂා කොට ඔවුන්ගෙන් ධනය ගත යුතු යි.' මහාභාරතය, (ශාන්ති පර්වය 1 කොටස), (2006), 120: පි. 331) ආදි වශයෙන් බදු අයකිරීම සම්බන්ධ පැහැදිලි විග්‍රහයක් මහාභාරතය තුළ අන්තර්ගතව පවතී.

අයබදු ගත යුතු ආකාරය පිළිබඳ පැහැදිලි විග්‍රහයක යෙදෙන ශුක්‍රාචාර්ය තෙමේ 'යම් ආකාරයකින් මල්කරුවකු ගසක් උත්සාහයෙන් ආරක්ෂා කොට එහි ගෙඩි මල් ලබා ගනියි ද, ඒ ආකාරයෙන් ම අයබදු ගන්නා රාජපුරුෂයා ප්‍රජාවගෙන් බදු අය කරගත යුතු යැයි පෙන්වා දී තිබේ. (ශුක්‍රනීති, (1952), 2: ශ්ලෝක 171) මිනිස්සු උක්ගස් සේ අඹරා දමා පීඩනයට ලක්කොට ඔවුන්ගෙන් ධනය අයකර නොගත යුතු ය. එම ක්‍රියාවලියේදී සම්පූර්ණයෙන් ම උක්ගස විනාශ වන්නා සේ ප්‍රජාව ද විනාශ විය හැකි ය. මාලාකාරයෙක් මල් ගස ආරක්ෂා කරගනිමින් එහි ඵලය විඳගන්නා සේ රට වැසියා ආරක්ෂා කර ගනිමින් බදු ගත යුතු බව ශුක්‍රාචාර්ය තෙමේ අවධාරණය කර ඇත. ඉදින් කිසියම් රටක මානව සම්පත පීඩාවට පත්වූ කල රජුට රාජ්‍යය පවත්වාගෙන යාමට ප්‍රජාවගේ සහාය ලැබෙන්නේ නැත. තල් ගස්, ඉඳි ගස්වලින් අවශ්‍ය රසය එම ගස්වලට අවම පීඩාවක් ගෙන දෙන පරිද්දෙන් ගනු ලබන්නේ යම්සේ ද එසේ රජු ප්‍රජාවගෙන් ධනය ගත යුතු ය. ඉදින් එහිදී රජු ජනයාගේ අය - වැය පිළිබඳව සැලකිලිමත් විය යුතු ය. ප්‍රජාවගේ අය - වැය කලින් කලට වෙනස් වන බැවින් සිය බදු ප්‍රතිපත්තිය ද කලින් කලට සුදුසු පරිදි වෙනස් කිරීමට පාලකයා ද කටයුතු කළ යුතුව ඇත.

බදු අයකර ගැනීමේදී රජු උපක්‍රමශීලී විය යුතු ය. ප්‍රජාව හැමකල්හී එකම ආකාරයෙන් රජුට බදු ගෙවීමට බැඳී නොසිටින බැවින් රජු රජයේ විවිධ අවශ්‍යතා කලින් කල මහජනයා ඉදිරියට ගොස් දන්වා, සිය අවශ්‍යතා සාධාරණය කොට මහජනයා බදු ගෙවීමට පොළඹවාලිය යුතු ය. කැලෑ සිය වාසස්ථාන කරගෙන සිටින සොරුන් සිය රාජ්‍යයෙන් බැහැර කොට, ඔවුන්ව භේද කොට, මධ්‍යම හෙවත් ගමේ අයගෙන් ධනය රැස්කිරීමට පාලකයා අවධානය යොමු කළ යුතු ය. එසේ කළ විට සැපට හා දුකට පත් දෙයාකාරයේ අය රජු කෙරෙහි නොකිපෙනු ඇත. රජුට බදු ගෙවීම අවශ්‍ය වන්නේ යැයි වරින්වර සිය රාජ්‍ය තුළ සියලු තන්හි දැනුම් දිය යුතු ය. එසේ ම රටට පැමිණෙන බිය පිළිබඳව සැලකිලිමත් විය යුතු ය. අනතුරුව ගමේ ප්‍රජාවට මෙසේ කියා බිය ඇති කළ යුතු ය. එනම් සතුරන්ගෙන් විශාල ආක්‍රමණරූපී විපතක් ඇති වී තිබේ. උණගසක අරටුව මෙන් විපත විනාශයේ මූලය වෙතොත් එය විනාශ කිරීමට කල්පනා නොකළ යුතු ය. අපගේ සතුරා සිය විනාශය උදෙසා ම බොහෝ සොරුන් සමඟ ප්‍රබල වී මෙම රාජ්‍යයට පීඩා කිරීමට කැමති වෙයි. මෙම පැමිණ ඇති දරුණු විපත හා ප්‍රචණ්ඩ බියෙන් මම ඔබ ආරක්ෂා කිරීම උදෙසා ඔබගෙන් ධනය ගැනීමට කැමැත්තෙමි. එළඹ ඇති බිය විනාශ වීමෙන් ම මම ඔබට සියලු ධනය ආපසු දෙන්නෙමි. එහෙත් සතුරන් බලහත්කාරයෙන් මෙම රාජ්‍යයෙන් ධනය පැහැර ගතහොත් එය නැවත කිසිදා ආපසු නො ලැබෙනු ඇත. සතුරා ආක්‍රමණය කිරීමෙන් පළමු ඔබගේ ස්ත්‍රීන්ට බිය

ඇතිවනු ඇත. ඔබ විසින් ම සිය ධනය විනාශ කරගන්නේ ය. ස්ත්‍රීන් හා පුත්‍රයින් ආරක්‍ෂා කිරීම උදෙසා ධනය රැස් කිරීම අවශ්‍ය වෙයි. යම්සේ දරුවාගේ උන්නතියෙන් පියාට සතුටක් වෙයි ද, එසේ ම ඔබගේ සමෘද්ධියෙන් මම සතුටක් විඳිමි. රටට පැමිණි උවදුර නිවාරණය කිරීම උදෙසා මම ඔබගේ රටට කරදරයක් නොකොට ඔබගේ ශක්ති ප්‍රමාණයෙන් ධනය ගනිමි. (මහාභාරතය, (ශාන්ති පර්වය 1 කොටස), (2006), 88ඃ පිටු. 251, 252) මේ ආදි වශයෙන් රජු උපක්‍රමශීලීව සිය රට වැසියා බියට පත් කර සිය අවශ්‍යතා එනම් බදු අය කරගැනීම සිදු කළ යුතු බව මෙයින් පැහැදිලි කර දී තිබේ. මෙයින් පැහැදිලි වන ප්‍රධාන කරුණ වනුයේ රජුගෙන් ප්‍රජාව මූලිකව අපේක්‍ෂා කරන්නේ ආරක්‍ෂාව බව ය. සිය ආරක්‍ෂාව සුරක්‍ෂිත කිරීම සඳහා රජුට බදු ගෙවීම සාධාරණීය කිරීමේ මානසික උත්තේජනය මෙයින් ඇති කර තිබේ. හුදෙක් බදු අවශ්‍ය වන්නේ කුමට ද? එය ඔබගේ පවුල සුරක්‍ෂිත කිරීමටයි. එසේ හෙයින් සතුරාගෙන් ඔබ ගලවාගෙන යහපත් දිවියක් ඇතිකර ගැනීමට මා වෙනුවෙන් ධනය දීම වඩාත් උචිත බව පාලකයා ජනතාවට ඒත්තු ගැන්වීමෙන් රජුගේ අපේක්‍ෂා සඵල කරගත හැකි බව මෙයින් පැහැදිලි කෙරේ.

සිය රාජ්‍යයේ මෙන්ම රජුගේ ද බර දැරිය යුතු වන්නේ ප්‍රජාවයි. 'යම්සේ උතුම් වෘෂභයෙක් දුර්ගම ස්ථානවල විශාල බරක් උසුලාගෙන යයි ද, එසේ ම ඔබට ද මෙම විපත් අවස්ථාවේ යම්කිසි බරක් ඉසිලීමට සිදුවනු ඇත. විපතක් පැමිණි විට ධනය ඉතා ප්‍රිය යැයි සිතා එය සැඟවීම උචිත නොවේ. අනතුරුව අවස්ථා විධි දත් රජු මෙසේ විනීත හා මිහිරි වදන්වලින් ප්‍රජාවට කරුණු අවබෝධ කරදී ධනය ගැනීමේ උපායවල එල්බ, සිය සේවකයන් හා පාබල සමූහය ප්‍රජාව වෙතට ධනය ගැනීම සඳහා යැවිය යුතු ය. රජු ප්‍රචාරක කාර්ය, සේවකයන් හා සෛනිකයන් පෝෂණය කිරීම, වෙනත් ආවශ්‍යක ධනය, යුද බිය නිවාරණය කිරීම හා සියලු යෝගක්ෂේම සිදු කළ යුතු වෙයි. එහි අවශ්‍යතාව පෙන්වා වෛශ්‍යන්ගෙන් ද බදුගත යුතු යි. වෛශ්‍ය ප්‍රජාවගෙන් බදු ගැනීමේදී රජු ඉතා ප්‍රවේශන් විය යුතු ය. ඔවුන් තළා පෙළා අනවශ්‍ය කරදර කරමින් බදු ගැනීමට ක්‍රියා කරන්නේ නම් ඔවුන් රාජ්‍යය අත්හැර වනයට යනු ඇත. එනිසා ඔවුන් කෙරෙහි මෘදු ලෙස ක්‍රියා කළ යුතු යි. ඔවුන් කෙරෙහි රජු කෝමල බදු පැනවිය යුතු ය. (මහාභාරතය, (ශාන්ති පර්වය 1 කොටස), (2006), 88ඃ පිටු. 252, 253)

සිය රාජ්‍යයට විපතක් නම් ධනයට කොතරම් ආශා වූව ද රාජ්‍යයට ධනය අවශ්‍ය නම් සැඟවීමකින් තොරව ධනය ලබාදීමට ප්‍රජාව කාරුණික විය යුතු ය. එය ප්‍රජාවගේ යුතුකමකි. වෘෂභයෙක් යාමට අපහසු ස්ථානවලත් විශාල බරක් උසුලාගෙන යයි ද එපරිද්දෙන් ප්‍රජාව රජයට අපහසු වෙලාවේ එහි බර දැරීමට සූදානම් විය යුතු ය. මෙවැනි අවස්ථාවක ප්‍රජාවගෙන් ධනය ලබා ගැනීමට රජු මිහිරි සිත් ගන්නා වදන්වලින් ප්‍රජාව ආමන්ත්‍රණය කළ යුතුව ඇත. රජු ඒ සඳහා විවිධ ප්‍රයෝග අනුගමනය කළ යුතු යි. වෛශ්‍යවරු යනු රාජ්‍යයක සිටින ධනවතුන් ය. ඔවුහු රජයට බදු දීමට බැඳී සිටිති. නමුත් ඔවුන් අනවශ්‍ය ලෙස තළා පෙළා නොදැමිය යුතු ය. ඔවුන් පිට අනවශ්‍ය පීඩනයක් ඇති වුවහොත් ඔවුන් සියල්ල අත්හැර වනගත විය හැකි ය. එවිට රාජ්‍යයට ලැබිය යුතු අයබදු කිසිවක් ලැබෙන්නේ නැත. බදු අයකිරීමේදී මේ ආදි වශයෙන් සියලු අංශ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම අත්‍යවශ්‍ය කරුණක් ලෙස පෙන්වාදිය හැකි ය.

බදු අයකිරීම සම්බන්ධයෙන් තවදුරටත් කරුණු දක්වන භාරතීය මූලාශ්‍රය, 'යම්සේ පැටියා මවගේ තනය සපා නොකා හුදෙක් කිරි දොවයි ද, එසේ ම මිනිස්සු මීමැස්සන්ට පීඩා නොකොට ම මධු පානය කරති. එයාකාරයෙන් රජු රාෂ්ට්‍රරූපී ගවයාගෙන් ධනය ගනියි. රජතුමනි, යම්සේ කොටි දෙනක් සිය පැටියා දත්වලින් අල්ලා පහතට හෙළිය නොහැකි සේ එය පැහැර ගෙන යන්නී ය. එසේ ම මකුණා මෘදු බවෙන් ලේ බොයි. රජු ද ඒ ආකාරයෙන් ම කෝමල බවෙන් රට දෙවිය යුතුයි. ප්‍රජාව පාලනය කරන රජු පළමුව ප්‍රජාවගෙන් ස්වල්ප බදු අයකොට, එය වර්ධනය කරමින් ඊළඟ වර්ෂයේ එය තවත් වැඩි කරමින් ක්‍රමාණුකූලව බදු ගැනීම වර්ධනය කරගත යුතු ය. මෙහිදී එය කළ යුතු වන්නේ ස්වල්ප වර්ධනයක් පමණි. යම්සේ වස්සන් ඉතා උත්සාහයෙන් පාශ (නාස් ලණු) දමා ක්‍රමයෙන් බර ඉසිලීමට දමනය කරයි ද, එසේ ම ප්‍රජාව කෙරෙහි ද පළමුව අඩුවෙන් බදු අය කොට ක්‍රමයෙන් වර්ධනය කළ යුතුයි. ඉදින් වසු පැටවුන්ට නාස් ලණු දමා බර ඉසිලීමට යමෙක් උත්සාහ කරන්නේ නම් එය පහසු කාර්යයක් නොවේ. මන්ද තත් අවධියේ උන් සම්පූර්ණ බර ඉසිලීමකට සමත් නොවන බැවිනි. එනිසා සුදුසු ක්‍රමයකින් බර ඉසිලීමට පුරුදු පුහුණු කළ යුතු යි. එවිට සම්පූර්ණ බර ඉසිලීමට සමත් වෙයි. ඒ ආකාරයෙන් සියලු දෙනා ම තම වසඟයට ගැනීමට හැකි වන්නේ නැත. එනිසා බදු ගෙවිය හැකි ප්‍රධාන පුද්ගලයන් මිහිරි වදන්වලින් ශාන්ත භාවයට පත්කොට, වසඟයට ගැනීමට කටයුතු කළ යුතු යි. (මහාභාරතය, (ශාන්ති පර්වය 1 කොටස), (2006), 88ඃ පි. 253)

ක්‍රමාණුකූලව බදු අයකර ගැනීමේ උපායත් එය වර්ධනය කරගැනීමේ උපායත් මෙයින් මොනවට පැහැදිලි කර ඇත. මෙවැනි බදු ප්‍රතිපත්තියක් හා ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම මඟින් භාණ්ඩාගාරය සමෘද්ධිමත් කරගත හැකි අතර ම රාජ්‍යය තුළ අසහානිකාර තත්ත්වයක් වර්ධනය වන්නේ ද නැත. බදු අයකර ගැනීම සඳහා අනුගමනය කරන ක්‍රමවේද තුළින් ධනය හිමි අය අසහනකාරි තත්ත්වයට පත් නො කළ යුතු ය. ඔවුන් පීඩාවට පත්වුවහොත් තමන් අපේක්‍ෂිත බදු ආදායම් ලද නො හැකි ය. එසේ ම භාණ්ඩාගාරය ක්‍ෂණිකව සංවර්ධනය

කිරීමට උත්සාහ නොකොට එය ක්‍රමාණුකූලව වර්ධනය කරගැනීමට කල්පනා කළ යුතු බව මෙයින් පැහැදිලි කෙරේ. ප්‍රජාවට නොදැනෙන ලෙස වසරින් වසර වර්ධනාත්මක ප්‍රවේශයකින් එය කිරීම වඩාත් උචිත වන අතර අවස්ථාවට හා කාලයට ප්‍රතිකූලව ප්‍රජාව මත අයබදු නොපැවරිය යුතු ය. අවස්ථානුකූලව ශාන්ත ලෙස ක්‍රමයෙන් අයබදු බර පැටවිය යුතු නමුත් යම්කිසි විපත් කාලයකදී හැර අනෙක් කාලවලදී කිසිවකුගෙන් අයබදු ගෙන ධනය රැස් නො කළ යුතු බවක් ද මෙයින් පෙන්වා දී තිබේ.

අයබදු ගත යුතු ආකාරය පිළිබඳව කරුණු දක්වන මනුගේ අදහස් ද මහාභාරතයේ එන අදහස් හා සමාන වන බවක් පෙන්නුම් කෙරේ. මනුස්මෘතියේ සඳහන්ව ඇති ආකාරයට රජුට ත් වැඩකරුවන්ට ත් සාධාරණ වාසියක් ලැබෙන ලෙස මැනවින් සලකා බලා රජු තම විජිතයේ බඩු මිල හා අයබදු නියම කළ යුතු ය.

''යථා එලේන යුජ්‍යේත රාජා කර්තා ච කර්මණාම්
තථාවේක්ෂා නෘපෝ රාෂ්ට්‍රේ කල්පයේත් සතතං කරාන්'' (මනුස්මෘතිය සහ මානවශිෂ්ටාචාරය, (2001), 7: ශ්ලෝක 128) යම්සේ කුඩැල්ලා, වසුපැටියා හා බඹරා ටිකින් ටික තමාගේ ආහාර (පිළිවෙළින් ලේ, කිරි හා මීපැණි) ග්‍රහණය කරයි ද, ඒ අයුරින් රජු ප්‍රජාවගෙන් ටිකෙන් ටික වාර්ෂික බදු අය කළ යුතු බව මනුගේ අදහසයි.
''යථාල්පාල්පමදන්ත්‍යාද්‍යං වාර්යෝකෝවත්ස ෂට්පදාඃ
තථාල්පාල්පෝ ග්‍රහීතව්‍යෝ රාෂ්ට්‍රාද් රාඥාබ්දිකඃ කරඃ'' (මනුස්මෘතිය සහ මානවශිෂ්ටාචාරය, (2001), 7: ශ්ලෝක 129)
මෙයින් පැහැදිලි කරනුයේ රජු ස්වල්ප වශයෙන් අයබදු ගත යුතු බව ය. බුද්ධිමත් පාලකයෙක් නම් අවස්ථාවට අනුව ම ධනය සංග්‍රහ කළ යුතු අතර, සිය ආර්ථික ශක්තිය කිසිවකු ඉදිරියේ ප්‍රකාශ නො කළ යුතු ය. බුද්ධිමත් මිනිසා ගවදෙන ආරක්‍ෂා කොට කිරි දොවයි ද, එසේ ම රජු පෘථිවිය පාලනය කොට ඔවුන්ගේ ධනය දොවාගත යුතු ය. යම්සේ බඹරුන් යථා ක්‍රමයෙන් මල්වලින් මීපැණි ග්‍රහණය කරයි ද, එසේ ම රජු ප්‍රජාවගෙන් ක්‍රමයෙන් ද්‍රව්‍ය ග්‍රහණය කොට රැස් කළ යුතු ය. රාජ්‍යයේ ආරක්‍ෂාව වෙනුවෙන් ධනය යෙදවීමෙන් පසුව භාණ්ඩාගරයේ කිසියම් අතිරික්තයක් වේනම් එම ධනය ධර්මය හා වෙනත් වැදගත් කාර්යයන් සඳහා යෙදවිය යුතු ය. බුද්ධිමත්, ශාස්ත්‍ර දත් පාලකයා කිසිසේත් සංචිත ධනය කිසිවිටෙකත් වැය නො කළ යුතු ය. (මහාභාරතය, (ශාන්ති පර්වය 1 කොටස), (2006), 120: පි. 333) මූලාශ්‍රයේ සඳහන්ව ඇති ආකාරයට පාලකයකු සිය ප්‍රජාවගෙන් අයබදු ගත යුත්තේ ප්‍රජාවට හිරිහැරයක් නොවන ආකාරයෙනි. බුද්ධිමත් මිනිසා ගව දෙනගෙන් කිරි දොවා ගැනීම, බඹුරුන් ක්‍රමාණුකූලව මල්වලින් මී පැණි රැස්කිරීම යන උපමා සිය ජීවය කරගෙන පාලකයා ජනයාට කිසිදු පීඩාවක් නොවන ලෙස ක්‍රමාණුකූලව අයබදු ගැනීමේ ක්‍රමවේදයක් ක්‍රියාවට නැංවිය යුතු ය. එවැනි ක්‍රමවේදයකදී ප්‍රජාවට දැනෙන පීඩනය අවම මට්ටමක පවතී. මිනිසුන්ගේ ආදායම් තත්ත්වය හැමකල්හී එක හා සමාන නොවන හෙයින් රජුට හැමකල්හී එක හා සමාන අයබදු ලැබෙන්නේ ද නැත. ස්වාභාවික විපත්, අස්වැන්න අඩුවීම, කෘමි විනාශය ආදි කොට ඇති විවිධ උපද්‍රව නිසා අස්වැන්න කලින් කලට වෙනස් විය හැකි ය. එවැනි සාධක හමුවේ ඇතැම් කාලපරිච්ඡේදයන්හී පාලකයා අල්ප ධනයක් ලැබිය හැකි ය. ඉදින් එවිට කිසිවිටෙකත් බුද්ධිමත් පාලකයා ජනයාට නින්දා නො කළ යුතු ය.

රජු තමාට විශ්වාසය ඇති අයගෙන් බදු ගත යුතු බවත් අයබදු ගැනීමේදී නීත්‍යානුකූලව එය කළ යුතු බවත් ප්‍රජාවට යහපත ඇතිවන සේ තත් කාර්යයන් කළ යුතු බවත් මනුගේ අදහසයි. (මනුස්මෘතිය සහ මානව ශිෂ්ටාචාරය, (2001), 7: ශ්ලෝක 81) ඉදින් කිසියම් පාලකයෙක් අඥානකමින් සිය රාජ්‍යය නොබලා ධනය රැස් කරන්නේ ද, එනම් ප්‍රජාව ආරක්‍ෂා නොකොට නීත්‍යානුකූල නොවන ලෙස නොයෙක් ආකාර වූ බදු ගනී නම් ඔහු වහාම රාජ්‍යයෙන් ගිලිහී සිය නෑයන් සහිතව ජීවිතයෙන් ද විනාශයට ගමන් කරයි. සත්ත්වයන්ගේ ශරීරය විනාශ වීමෙන් ක්‍ෂය බවට පත්වන්නේ යම්සේ ද එසේ රටට පීඩා ගෙන දෙන රජුගේ ප්‍රාණය ද ක්‍ෂය වී යයි. (මනුස්මෘතිය සහ මානව ශිෂ්ටාචාරය, (2001), 7: ශ්ලෝක 111-112) ආදි වශයෙන් එන ඉගැන්වීම්වලින් පැහැදිලි වනුයේ රජු නීත්‍යානුකූලව, ප්‍රජාවට පීඩාවක් නොවන පරිදි බදු අය කළ යුතු බව ය. මෙම මූලාශ්‍රය විග්‍රහයෙන් පැහැදිලි වනුයේ බදු ගැනීම, වියදම් පිළිබඳ විමසා බැලීම, සේවා හා කාර්යයන්වලට අනුරූප වන ලෙස කළ යුතු බව ය.

ව්‍යාපාරික ක්ෂේත්‍රය තුළ ධනවත් හා සාමාන්‍ය වෙළඳ ප්‍රජාව යැයි කොටස් දෙකක් හඳුනාගත හැකි ය. ඉදින් මේ සියලු දෙනාගෙන් එක හා සමාන ලෙස බදු ගැනීම සුදුසු වන්නේ නැත. විශේෂයෙන් ම රටේ ව්‍යවහාරවලින් (පලා ආදි සාමාන්‍ය දෑ අලෙවි කරන, මිලදී ගන්න) ජීවත් වන සාමාන්‍ය වෙළෙන්දන්ගෙන් ඉතා ස්වල්ප වූ බද්ධක් වාර්ෂිකව ගත යුතු බව මනුගේ අදහසයි. (මනුස්මෘතිය සහ මානව ශිෂ්ටාචාරය, (2001), 7: ශ්ලෝක 137) අධික බදු අය කිරීම ද බදු අයකිරීමෙන් බැහැරව සිටීම ද රාජ්‍යයේ පැවැත්මට හිතකර නොවේ. සිය හිතවතුන් රාජ්‍යභාරයෙන් නිදහස් කිරීම ඥානාන්විත ක්‍රියාවක් නොවේ. (මනුස්මෘතිය සහ මානව ශිෂ්ටාචාරය, (2001), 7: ශ්ලෝක 139) එසේ ම අධික තණ්හාව පෙරදැරි කරගෙන අධික බදු මහජනයා පිට පැවරීම ද සුදුසු තත්ත්වයක් නොවේ. මේ කියනු ලබන කාර්යද්වයෙන් ම රජුත් රටත් විනාශ විය හැකි ය. රාජ්‍යභාරය පොදු කරුණක් ලෙස සලකා ක්‍රියාවට නැංවිය යුතු බව මෙයින් පැහැදිලි කර තිබේ.

නිගමනය

භාණ්ඩාගාරය රාජ්‍යයේ මූලය වන බැවින් එහි නායකත්වයට ත්‍රෛ කාලියේ ම ආර්ථිකය පිළිබඳ මනා පරිචයක් තිබෙන, ආර්ථිකමය අතින් ශක්තිමත්, ධෛර්වන්ත, ඉවසීම ප්‍රගුණ කළ, ශ්‍රේෂ්ඨ ගති ලක්‍ෂණ සහිත පුද්ගලයන් අතට පත්කිරීමට පාලකයා වගබලා ගත යුතු බව භාරතීය සාහිත්‍ය මූලාශ්‍රය අවධාරණය කර ඇත. භාණ්ඩාගාරයේ භාරකාරත්වයට එක් අයකු පත්කිරීම නුසුදුසු තත්ත්වයක් ලෙස හැඟී යන්නේ නම් ඉහත ලක්‍ෂණවලින් පිරිපුන් පස් දෙනකුගේ භාරකාරත්වයට එය නතු කළ යුතු බව මූලාශ්‍රය පැහැදිලි කොට තිබේ. ඉහත මූලාශ්‍රය විවරණයන්ට අනුව පාලකයා ජනතාවගෙන් බදු අයකර ගත යුතු වන්නේ ඔවුන් ආරක්‍ෂා කිරීමේ මූලික නිර්ණායකයන්ට යටත්ව ය. සමස්ත රටවැසියාගෙන් බදු අයකර ගත යුතු නමුත් සාමාන්‍ය ජනයාට සාපේක්‍ෂව මහාපරිමාණ වෙළඳ ප්‍රජාවගෙන් අයකරගන්නා බදුවල වෙනසක් තිබිය යුතු ය. වෙළඳ ප්‍රජාව වුව සුළු හා මහාපරිමාණ යනුවෙන් දෙයාකාර වන අතර බදු අයකර ගැනීම ද ඒ අනුව දෙයාකාර විය යුතු ය. අමාරුම අවස්ථාවකදී වුව ජනයාගෙන් බදු අයකරගත යුතු නමුත් අනවශ්‍ය ආකාරයෙන් ප්‍රජාව තලා පෙළීමෙන් වැළකී එය කළ යුතුව ඇත. ප්‍රජාව අසහානයට පත් නොවන ආකාරයේ බදු ප්‍රතිපත්තියක් ක්‍රියාවට නංවමින් බදු අයකර ගත යුතු අතර සෑම පාලකයෙක් ම ප්‍රජාවගේ යටිතල පහසුකම් එසේත් නැති නම් ධනය උත්පාදනය කරගැනීමේ ක්‍රමවේද ඇති කිරීමෙන් පසුව අයබදු එකතු කරගැනීමට අවධානය යොමු කළ යුතු බව ඉහත සඳහන් කළ කරුණුවලින් අනාවරණය කරගත හැකි ය.

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

අර්ථශාස්ත්‍රය, (අධිකාර 1-2), (2003) (අනුවාදක.), හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

අර්ථශාස්ත්‍රය, (අධිකාර 8-15) (2003), (අනුවාදක.), හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ, (2001), පුරාතන භාරතීය පාලන මූලධර්ම, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

භාෂා ටීකා සහිත ශුක්‍රනීති, (1, 2, 3, 4), (1952), (සංස්.), ඛේමරාජ - ශ්‍රී කෘෂ්ණදාස, ඉන්දියා: කර්තෘ ප්‍රකාශනයකි.

මනුස්මෘතිය හා මානව ශිෂ්ටාචාරය, (2001), (පරි.), නාගොඩ ආරියදාස සෙනෙවිරත්න, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

මහාභාරතය, (ශාන්ති පර්වය), හනුමානප්‍රසාද පෝද්දර ප්‍රකාශන, (ඉන්දියා), (වර්ෂයක් සඳහන් නොවේ) මූලාශ්‍රය අන්තර්ජාලය.

මහාභාරතය, (ශාන්ති පර්වය 1 කොටස), (2006), (පරි.), හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

හිතෝපදේශය, (මිත්‍රලාභය) (1993), (සංස්.), සිරි තිලකසිරි, කොළඹ: රත්නපොත් ප්‍රකාශකයෝ.

හිතෝපදේශ ශ්‍රී සුමංගල අභිනව ව්‍යාඛ්‍යාව, (සුහෘද්භේදය), (1996), (සම්පාදක.), පහමුණේ ශ්‍රී සුමංගල ස්ථවිර, කොළඹ: සමයවර්ධන මුද්‍රණකරුවෝ සහ පොත් ප්‍රකාශකයෝ.